# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,142- 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 194 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 195 |

*සැ. යු.* - ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 11 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

193- B 081561 - 353 (2019/09)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. ප්‍රාදේශීය ලේකම්, එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.02.21 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 39609 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මඩිගෙ මිදියාල, බණ්ඩාරකොස්වත්ත පදිංචි උදුමා ලෙබ්බේ ගුරුන්නැහැලාගේ අහමදු ලෙබ්බේ වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක D223/1083/94 යටතේ 1994.03.22 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය, උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය. 2019.10.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවමැදි හත්පත්තුවේ තිස්සව කෝරළේ 1360 - මඩිගෙ මිදියාල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මඩිගෙ මිදියාල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කුරුණෑගල මිනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 2265 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක.. 207 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 0.431 රූඩ් පර්චස් ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැකවෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම කෝලමරන්තදිහේනඃ

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 205 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 208 |
| *දකුණට* | : | කැබලි අංක 10 සී |
| *බස්නාහිරට* | : | කැබලි අංක 206. |

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්, (*වැ. බ.*)
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පඩුවස්නුවර - බටහිර,
හෙට්ටිපොල.

2019.06.04

09-768/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1993.03.06 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 35740 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඇටුවන්මුල්ල, මණ්ඩාපොල පදිංචි මහාවාරි නයිදෙලාගේ සමාරිස් හාමි වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක D233/1799/93 යටතේ 1993.07.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.10.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුගම්පල හත්පත්තුවේ කරඳාපත්තු කෝරළේ 1353 - දිග්ගලගෙදර ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ ඇටුවන්මුල්ල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කුරුණෑගල මිනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1728 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 33 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර - 0.225 රූඩ් පර්චස් ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම තල්ගහමුලහේන ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 32 |
| *නැගෙනහිරට* | : | බලදොර කෝරළේ කෝරළ මායිම |
| *දකුණට* | : | කැබලි අංක 34 |
| *බස්නාහිරට* | : | කැබලි අංක 22 |

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්, (*වැ. බ.*)
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පඩුවස්නුවර - බටහිර,
හෙට්ටිපොල.

2019.06.04

09-768/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/51277.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය EP/28/LB/LS/BAT/MNW/11.

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මඩකලපුවේ දිස්ත්‍රික්කයේ, මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වව්නතිව් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගාන්ධිනගර් ගමේ දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් පර්. 20ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීමට වාණිජ කටයුතු සඳහා ඩයලොග් ආසියාටා පීඑල්සී විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම ; |
| *දකුණට* | : | ආර්. ඩී. එස්. ගොඩනැගිල්ල ; |
| *බටහිරට* | : | එරුනූර්විල් වීදිය. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2019.07.18 දින සිට 2049.07.17 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) කට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය,

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ)* 2019.07.18 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවැරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජී. ප්‍රණවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-729

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/60131.
පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- EP/28 /LB/LS/ Tri/T&G/205.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලේකම් කොට්ඨාසයේ අංක 243 A ආන්දම්කුලම් ග්‍රාම නිලධාරී වසමේ ආන්දම්කුලම් ගමේ පී.පී.ත්‍රි 30 පිඹුරේ කැබලි අංක 579 සහ 580 සඳහා අඳින ලද අනුලේඛන අංක 1039 හි කැබලි අංක 1 ක වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1022 කට අදාළව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ආගමික කටයුතු සඳහා ත්‍රිකුණාමලය අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමේ කැබලි අංක 1 හි මායිම් මෙහි පහත සඳහන් වේ:

*උතුරට* : කැබලි අංක 561 (පාර) සහ කැබලි අංක 578
*නැගෙනහිරට* : කැබලි අංක 578 සහ කැබලි අංක 581
*දකුණට* : කැබලි අංක 581,582,583 සහ කැබලි අංක 584
*බටහිරට* : කැබලි අංක 584 සහ 561 (පාර).

02.ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.07.08 දින සිට වසර තිහක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* :- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2019 ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* මෙම ඉඩම ආගමික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී ප්‍රාදේශිය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* ප්‍රාදේශිය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධනය තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණක් සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2019.07.08 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හී දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට සති 06 ක් ඇතුළතදී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-554

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/22087 (xxi).
මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී /එල්සී/එල්ඩී/4/1/4/552.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 691 - කුණ්ඩසාලේ උතුර ග්‍රාම නිලධාරී වසමේ කුණ්ඩසාලේ ගමේ මු. පි. මහ 5253 පිඹුරේ කැබලි අංක 16න් දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0529ක් වූ රජයේ ඉඩම් කොටස මුදියන්සේලාගේ කුමුදු සමන් ශ්‍රී රත්නායක මහතා විසින් නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ : -

*උතුරට* : කැබලි අංක 07, 08, 09 ;
*නැගෙනහිරට* : කැබලි අංක 15 ;
*දකුණට* : කැබලි අංක 19 ;
*බටහිරට* : කැබලි අංක 17.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2019.08.08 සිට වසර 30ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1994 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

*වාර මුදල*.- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.08.08 සිට වසර 05ක් ගත වන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාක් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් පැවරීම් හා අතුරු බදු දීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. අයෝධ්‍යා එස්. ජයවර්ධන,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-553

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.